# කැලණිය විශ්වවිද්‍යාලය-ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි

දෙවන පරීක්ෂණය (බාහිර) - 2008

**BMGT E 2055/ BMGT 23055 – ව්‍යාපාරික තොරතුරු පද්ධති**

ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(01) තොරතුරු පද්ධතීන්ට මිනිසුන් වෙනුවෙන් තීරණ ගැනීමට නොහැකි නමුත් තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා සහය වියහැක. සංවිධානයක් සඳහා අවශ්‍ය සියලු තොරතුරු එක් පද්ධතියක් මගින් සැපයිය නොහැකිය.

(අ) තොරතුරු පද්ධති යන පදය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) සංවිධාන ධූරාවලියේ විවිධ මට්ටම් සඳහා සහාය වන ප්‍රධාන තොරතුරු පද්ධති පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ඉ) තොරතුරු පද්ධති මගින් ව්‍යාපාරයකට උපක්‍රමික වාසි ලබාදිය හැක යන ප්‍රකාශය පැහැදිලි කර අගයන්න.

(ලකුණු 06)

(02) (අ) "දත්ත ආදානය" යන්න දත්ත සැකසුම් චක්‍රයේ තිබිය යුතු ක්‍රියාකාරකම් අතරින් එකකි. එහි තිබිය යුතු අනෙකුත් අත්‍යවශ්‍ය ක්‍රියාකාරකම් උදාහරණයක් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) ගණුදෙනු සැකසුම් පද්ධතියක (TPS) සත්‍යකාල සැකසීම (real - time processing) හා බාණ්ඩ සැකසීම (batch processing) ප්‍රායෝගිකව භාවිතා වන අවස්ථා සන්සන්දනය කරන්න.

(ලකුණු 06)

(ඉ) නූතන ආයතන වල ගණකාධිකාරීවරුන්ට ඔවුන්ගේ කාර්යක්ෂමතාව වැඩිකරගැනීම සඳහා ගිණුම්කරණ තොරතුරු පද්ධති (AIS) කෙසේ භාවිතා කළ හැකිදැයි යන්න විස්තර කරමින් කෙටි රචනාවක් ලියන්න.

(ලකුණු 08)

(03) සුපිරි වෙළඳසැල් ජාලයක් තුල කළමනාකරණ තොරතුරු පද්ධති හා දත්ත සැකසුම් පද්ධති ගණනාවක් භාවිතා කරන අතර, තොග පාලන පද්ධතීන් හා විකුණුම් තොරතුරු පද්ධති ඊට අයත් වේ. විවිධ මට්ටම් වල පරිශීලකයන් අරමුණු කරගෙන මෙම පද්ධති වල ප්‍රතිදාන සිදුකෙරේ.

(අ) පහත සඳහන් එක් එක් වර්ගයන්ට අයත් පරිශීලකයන් සඳහා අවශ්‍ය තොරතුරු මට්ටම් දක්වන්න.

I සුපිරි වෙළෙඳසැල් තොග පරීක්ෂක

II සුපිරි වෙළඳසැල් ගබඩාවක නැවුම් ආහාර අංශයේ කළමනාකරු

III ප්‍රධාන කාර්යාලයේ ආයතන විධායක නිලධාරී

(ලකුණු 08)

(ආ) තොග පරීක්ෂක භාවිතා කරනු ලබන තොරතුරු ආයතන විධායක නිලධාරියා සඳහා නොගැලපෙන්නේ මන්දයි පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඉ) ඔබ සමාගමක තොරතුරු කළමනාකරු යැයි සිතන්න. එවිට ව්‍යාපාර සංවිධානයකට වෛරස් වලින් ආරක්ෂාවීම එතරම් වැදගත් වන්නේ ඇයි දැයි පහදන්න.

(ලකුණු 06)

(04) (අ) දිනපතා අන්තර්ජාලය තුල නව විද්‍යුත් වාණිජ්‍ය වෙබ් අඩවි සිය ගණනක් දක්නට ලැබෙන අතර, පරිශීලකයන් දහස් ගණනක් ද ඒ වටා එක් වේ. මෙම තත්ත්වය තුල ඔබගේ වෙබ් අඩවිය ප්‍රවර්ධනය කරන්නේ කෙසේද?

(ලකුණු 06)

(ආ) සමාගමක් ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු සඳහා වාසිදායක ලෙස අන්තර්ජාලය භාවිතා කල හැකි විවිධ ආකාර තුනක් විස්තර කරන්න.

(ලකුණු 08)

(ඉ) විද්‍යුත් වාණිජ්‍යයේ ගණුදෙනුවක් සිදුකිරීමේ ප්‍රධාන පියවර තුන මොනවාද?

(ලකුණු 06)

(05) (අ) B2B විද්‍යුත් වාණිජ්‍යයේ මූලික ලක්ෂණ මොනවාද?

(ලකුණු 06)

(ආ) යම් භාණ්ඩයක් විකිණීමේදී ඔබට ඒ සඳහා වඩාත් ඉක්මණින් හා ආරක්ෂා සහිතව ගෙවීම් ලබාගැනීමට අවශ්‍ය වේ. දැන් මේ සඳහා විද්‍යුත් වාණිජ්‍යයේ විකල්ප ගණනාවක් පවතී. ඒ මොනවාද? පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ඉ) අන්තර්ජාලය හා සම්බන්ධවීමේදී පරිගණකයකට ඇති ප්‍රධාන අභියෝග පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(06) දේශීය පිළිගත් විශ්වවිද්‍යාලයක් ඔවුන්ගේ පාඨමාලා මාර්ගගතව (on-line) ආරම්භ කර ඇත.

(අ) මාර්ගගත පාඨමාලා හදාරන්නෙකුට ලැබෙන වාසි දෙකක් විස්තර කරන්න.

(ලකුණු 08)

(ආ) මාර්ගගත පාඨමාලා හදාරන්නෙකුට සිදුවන අවාසියක් විස්තර කරන්න.

(ලකුණු 06)

(ඉ) මාර්ගගත පාඨමාලා සපයන විශ්වවිද්‍යාලයේ පාඨමාලා සංවිධායකයන්ට ලැබෙන වාසි දෙකක් විස්තර කරන්න.

(ලකුණු 06)